15 වන පිටුවෙන් (අදිසි)

“රණසිංහ මහත්තයා ආවා..”

“රණසිංහ මහත්තයා...?”

“ඔව්... ටිකක් වෙලා ඉඳියි වගේ... නැන්දට ඇහැක් නං මේක හදලා ගන්න.. ටිකක් මිරිස් ඉස්සරහට කරලා හදන්ඩ..” සුනන්ද ආපසු සාලයට යන්නට හැරෙන්නේ සමදරා යමක් කියන්නට පෙර ය.

“අයෝම දැන් ෆයිනල් ඉයර් එකේ නේද..?” රණසිංහ අසනු සුනන්දට ඇසෙයි.

“මොකක් හරි කලබලයක් වෙලා කැම්පස් එක වැහුවෙ නැත්නම්...” අයෝමා සාලයට එන සුනන්ද දෙස බලමින් කියයි.

“නෑ.. කලබලයක් වෙන්නෙ නෑ... එහෙම වෙන්ඩ හේතුවක් නෑ.. හැම සහෝදරයම ලොක්කට කීකරුයිනෙ දැන්.. ඉඳ හිටලා මිනිස්සුන්ට පේන්ඩ ඔය පොඩි පොඩි කොලොප්පමක් කරනවා විතරයි..”

අයෝමා රණසිංහට පිලිතුරක් දෙන්නට උත්සාහ නොකරයි. සියල්ලම වෙනස් වී ඇති බව ඇය ද දනියි. අවස්ථාවාදියෝ...ඕ සිතයි. හැම එකාම අවස්ථාවාදියෝ වෙලා..

අජිත් වාහනයේ තිබූ බීර බෝතල කීපය ගෙනවුත් රණසිංහ ඉදිරියේ ටීපෝව මත තබයි.

“අජිත් ආමි එකට ගියා කියලා සුනන්ද මට කිව්වා... මාව හම්බවෙන්න ආව නම් මං නෙකාහොම හරි වෙන රස්සාවකට දානවා..” රණසිංහ බීර බෝතලයක පියන ගලවන අතර කියයි.

“ඇයි..? ආමි එක හොඳ නැද්ද..?” ඒ අයෝමා ය.

“ඇයි නරක..”

“දේසපාලකයෙකුට පන්දම් අල්ලන්නෙ නැතිව යන්න පුලුවන් එකම රස්සාව මේකනෙ.. අපට උදව් කරන දේසපාලකයො කොහෙද ඉන්නෙ.. හිටියත් ඒ පස්සෙ යන්න හිත දෙන්නෙ නැහැ.. ඒ නිසා අයියා ආමි එකට ගියා”

“අයෝම පොඩ්ඩක්වත් වෙනස් වෙලා නැහැ... ඉස්සර වගේම තාමත් ඇණුම් පද කියන්න දස්සයි”

අයෝමා සිනාසෙයි. ඈ එසේ සිනාසෙන්නේ කියන්නට ඇති යමක් නොකියා සඟවාගන්නා විට බව සුනන්ද දනියි.

“අජිත් කවදද ආපහු යන්නෙ..?” රණසිංහ පුරවා ගන්නේ දෙවන බීර වීදුරුව ය.

“හෙට ආපහු යනවා මහත්තයා.. මේ නිවාඩුවට ආවෙත් හරිම අමාරුවෙන්.. මාසයක් දෙකක් ගෙදර අය දකින්නෙ නැතිව ඉන්නකොට සාංකාව වගෙයි.” අජිත් ගේ කටහඬෙහි ඇති කළකිරුණ ස්වරය රණසිංහට වැටහෙයි. මේ මිනිසුන් ගෙන් ඈත් සිට තමා මහා වරදක් කළේය යන හැඟීම ඔහුගේ සිතේ දැඩිව මතුව එයි. බීර මත ඒ හැඟීම් තව තවත් මතු කරයි.

“ඊළඟ සැරේ ආවාම මාව හමුවෙන්න එන්න.. ඔය රස්සාව අජිත්ට හරි යන්නෙ නැහැ..”

“එතකොට ඔය මහත්තයලගෙ යුද්ධ ව්‍යාපෘතියට යන කළ දසාව මොකද්ද..?” අයෝමා උපහාසයෙන් සිනාසෙයි. “අපි වගේ සාමාන්‍ය පන්තියේ මිනිස්සු යුද්දෙට ගියේ නැත්නම් ඔය මහත්තයලගෙ දිව්‍ය ලෝකෙ ගොඩ නගන්නෙ කව්ද...?”

“හිනාවෙන්න එපා අයෝමා.. ඔයා ඔහොම කතා කරනකොට මගේ හිත රිදෙනවා.. ඔයාලා මට සාමාන්‍ය අය නෙවෙයි.. ඈත් වෙලා හිටියත් ලෙංගතුකම් නැතිවෙලා නැහැ.. මතුපිටින් කොයි තරම් වෙනස් වුණත් මං තාමත් උඹලගෙ සමර් හට් එක යටට වෙලා රෑ තුන් තිස් පැයක් තිස්සෙ කතා කර කර හිටිය රණසිංහ අයියම තමයි.. උඹලට තේරෙන්නෙ නැහැ.. උඹල මට මහත්තයා කියල කතා කරන වාරයක් වාරයක් පාසා මගේ හිත කීරිග ැහිලා යනවා.. බෝතල් කටුවකින් පපුව හූරන්නා වගේ රිදෙනවා..”

මේ කතාව මෙතැනින් නවතිනවා නම් හොඳ යයි සුනන්දට සිතෙයි. සුව වෙමින් පවතින තුවාල අලුත් කර ගත යුතු නැත. එයින් වන යහපතක් නැත. කිසිවක් සිදු නොවුණා සේ ජීවිත ඉදිරියට ගෙන යා යුතු ය.

සමදරා කට ගැස්මට සෑදූ මස් දීසිය රණසිංහ ඉදිරියේ තබයි.

“නැන්දෙ...” රණසිංහ නැගිට ඇගේ දෑතින්ම අල්ලා ගනියි. ”මෙන්න මේකිට කියන්න නැන්දෙ මගේ හිත රිද්දන්න එපාය කියලා.. ආයෙම මොනා හරි කිව්වොත් මං මේකිගෙ කන කඩනවා..”

“කන කැඩුවට නම් කමක් නැහැ රණසිංහ අයියේ.. අතුරුදහන් කරන්නෙ නැතිව”

000000

පන්සල් බිමේ අලුත්ම වාහන කීපයක්ම නවතා තිබෙණු මහ ගේට්ටුව අසළදී ම තිසල්ට පෙනෙයි. ඒවා හඳුණාගන්නට ඔහු වෑයම් කරයි.

“බෙන්ස්.. වොල්වෝ.. බෙන්ස්.. වොල්වෝ..”

ඉදල දෙකකුල් අතර රුවාගත් සෙදෝරිස් බණ මඩුවේ කෙටි තාප්පය මත වාඩි වී සිටියි. ඔහු ගේ මුහුණේ සිනාවක සේයාවකුදු නැත.

“අතුගාන්නෙ නැද්ද..?” තිසල් අසයි. සෙදෝරිස් පිලිතුරක් නොදෙයි. තිසල් ඔහු පසු කර යන්නේ දෙබැම වකුටු කොට අභිනයෙන් “ඇයි..?” දැයි අසමින් ය. සෙදෝරිස් මුහුණ හරවා ආවාස ගෙය පෙන්වයි.

ආවාස ගෙයි ආලින්දයේ වාහන වලින් ආ ස්වාමින් වහන්සේලා ගේ බැරෑරුම් සාකච්ඡාවකි. සිංහයන් රැළක් මැදට වන් හාවකු සේ ලොකු හාමුදුරුවන් ඒ මැද වාඩි වී සිටිනු තිසල්ට පෙනෙයි. පොඩි හාමුදුරුවෝ මදක් මෑතින් කණුවකට වාරු වී බලා සිටිති. ඒ අතරින් යාම සුදුසු නැතැයි තිසල්ට සිතෙයි. ඔහු සාලය හරහා නොගොස් ආවාස ගෙයි පැති දොරෙන් ඇතුල් වී සුපුරුදු කාමරයට යයි. මේසය මත පොත් කීපය තබා ජනේලය විවෘත කරයි. නැවුම් හිරු රැස් තැඹිලි අතු අතරින් රිංගා අවුත් මේසය මත පතිත වෙයි. මඳ සුළඟෙ සෙළවෙන තැඹිලි අතු වල ඡායා මේසය මත රංගනයක යෙදෙයි.

සිතට ප්‍රබෝධයක් දැනෙයි. තිසල් පාඩම් පොතම මුහුණ ඔබා ගනියි. තේරුම් ගන්නට අපහසු විෂය කරුණු කෙටි සටහන් ලෙස කොලයක ලියා ගනියි.

පැයකට පමණ පසු වාහන පිටත්ව යන හඬ ඇසෙයි. සෙදෝරිස් ඉදලත් ඇදගෙන ආවාසයේ පසු පස දොර දෙසට යනු පෙනෙයි. කිසිවකු ගේ අඩි හඬක් පිටුපසින් ඇසෙයි. පොඩි හාමුදුරුවෝ තමා ගෙන ආ තේ කෝප්පය තිසල්ගේ මේසය මත තබති.

“බොන්න තිසල්” උන් වහන්සේ ගේ කටහඬ ස්වභාවික නැති බව තිසල්ට දැණෙයි. ඔහු හැරී උන්වහන්සේගේ මුහුණ බලන්නේ තමාගේ සැකය තහවුරු කරගන්නා අදහසින් ය. පොඩි හාමුදුරුවන් බලා සිටින්නේ තැඹිලි අතු අතරින් පෙනෙන නිල් අහස දෙස ය. ඒ දෑස් තුළ ගැබ් වුණ කැළඹිල්ල තිසල්ට දැණෙයි.

“උඹේ ඉස්සරහින් යන හතුරාට බය වෙන්න එපා.. ඒත් පිටිපස්සෙන් එන මිතුරා ගැන පරිස්සම් වෙයන් කියලා චීන කියමනක් තියෙනවා තිසල්..” පොඩි හාමුදුරුවන් ගේ කටහඬ ඇසෙන්නේ විනාඩි කීපයක නිහඬතාවකට පසුව ය. තිසල් හිස් තේ කෝප්පය මේසය මත තබා උන් වහන්සේ දෙස හැරී බලයි.

“පඤ්ඤාසීහ හාමුදුරුවොයි ජිනරතන හාමුදුරුවොයි උදේ පාන්දරම ආවෙ ඇයිද කියලා දන්නව ද..?”

“...”

“අපේ හාමුදුරුවන්ට මෙදා පාර ඡන්දෙ ඉල්ලන්නයි කියන්න..”

“ඡන්දෙ ඉල්ලන්න...?”

“විනාස කාලේ විපරීත බුද්ධි... රජවාසලට හාමුදුරු කෙනෙක් ගොඩ වුණත් උන්වහන්සෙට උස් ආසනේ පනවලා රජ්ජුරුවො පහත් ආසනේ වාඩි වෙනවා.. එහෙව් ගරු කටයුතු සාසනයක් මේක.. ගිහි සමාජයට ඉහළින් ඉඳන් අවවාද අනුශාසනා කරන්න ඕනෙ පූජනීය ඇත්තො ගිහියන්ටත් වඩා පහළට වැටෙනවා දකින්න අපි පව් කළානෙ ඇත්තට..”

“ලොකු හාමුදුරුවෝ කැමැත්ත දුන්න ද...?”

“මාත් බලාගෙන ඉන්නෙ ඒක දැනගන්න තමයි..”

*ලබන කළාපයට*


# ගායනා

**පන්ති ඇරඹේ.**

***මෙහෙයවීම*** –

සංගීත අධ්‍යක්ෂ
**තරුපති මුණසිංහ** BA(Kelaniya), MA(J’pura)

***ස්ථානය*** –

Glen Waverley Black Flat Community Centre. (Mel way ref. **71 C4**)
**Directions: Corner of Springvale Rd and Waverley Rd (adjoining "Le Pine Funeral Services")**

***වේලාව*** -

මෙම මස 25 වනදා සිට සෑම සිකුරාදාවකම සවස 6.30 ට.

**ළමා සහ වැඩිහිටි යන දෙපාර්ශවයම සඳහා වයස් පරතරයනට අනුව පන්ති පැවැත්වේ.**

විමසීම් – 0413745366 / (03)59405226 (6 pm - 11 pm)
www.Tharupathi.com

**එන්න! නිවැරදිව ගයන්න ඉගෙන ගන්න.**



# GATEWAY LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial
- Conveyancing - Sale or Purchase of Houses, Vacant Land, Units, Flats, Shops, Factories & Farms
- General, Medical or Enduring Powers of Attorney
- Wills & Estate Planning

*Professional, Quality Service Assured*

**Senanie Kurukularatne** LL.B, Grad Dip.LP
Barrister & Solicitor
Attorney -at- Law - Sri Lanka

Phone : 03 87869682
Fax : 03 87869681
Mobile : 0414 660 513
Email : gateway5@bigpond.net.au
17, Glenview Rise, Berwick, VIC 3806 Austraila